**කුරුණෑගල ප්‍රාදේශීය සභාව.**
**කුරුණෑගල දිස්ත්‍රික්කය.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණ අඩුපාඩු 06 කට අදාල වටිනාකම වූ රු.12,286,871 ක් ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණු අතර ගිණුම්කරණ අඩුපාඩු 02කට අදාළ වටිනාකම රු.7,238,118 ක් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව දන්වා සිටිමි. |
| (ආ) | ගිණුම් විෂයයන් 04 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.160,781,451ක් වූ නමුත් ඒවාට අදාල උපලේඛන අනුව ශේෂයන්ගේ එකතුව රු.107,214,100ක් වූ බැවින් රු.53,567,351ක වෙනසක් පැවතුණි. | නොසැසුඳුණු ශේෂ සසඳා නිවැරදි කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී උප ලේඛන හා ගිණුම් අතර ශේෂයන් සසඳා නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වටිනාකම රු.243,207,940ක් වූ ගිණුම් ශේෂයන් 7කට අදාළව සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | අදාල සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | පරිගණක උපාංග ලේඛනයක් ඉදිරියේදී පවත්වා ගෙන යාමට කටයුතු කරන අතර ආයෝජන සඳහා සභාව සතුව කිසිදු ලිඛිත සාක්ෂියක් නොමැත. |

**1.4** **අනුකූල නොවීම්**

-------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි දියුණු ප්‍රදේශ නිශ්චිතව කලින් කලට හඳුනාගෙන දියුණු ගම් ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නීතිරීති රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී කටයුතු කරන බව දන්වා සිටිමි. |

**02.** **මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 165,750,040 ක් වූඅතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 202,247,275 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

--------------------

**2.2.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්**

------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 වර්ෂය | | | | 2017 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගතආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 11,531,440 | 13,769,491 | 12,123,518 | 8,070,706 | 11,420,130 | 11,404,230 | 13,681,671 | 25,734,554 |
| බදු කුලී | 2,894,440 | 25,042,067 | 2,248,297 | 14,909 | 2,699,855 | 1,863,611 | 1,885,952 | 9,631 |
| බලපත්‍ර ගාස්තු | 1,839,800 | 1,778,204 | 1,778,204 | - | 1,839,800 | 2,512,637 | 803,363 | - |
| වෙනත් ආදායම් | 164,753,680 | 258,258,244 | 341,266,731 | 41,196,061 | 171,897,670 | 235,227,713 | 11,784,493 | 251,246,342 |
| එකතුව | 181,019,360 | 298,846,006 | 357,416,750 | 49,281,676 | 187,857,455 | 251,008,191 | 28,155,479 | 276,990,527 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වරිපනම් හා අක්කර බදු මුදල රු.8,070,706 ක් වූ අතර, ඉන් රු.4,194,626 ක් අවුරුදු 01 ත් 03 ත් අතර කාලයට අදාල හිඟයන් විය. | හිඟ ආදායම් කඩිනමින් රැස් කළ යුතුවේ. | ඉදිරියේදී කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබවිහරණය හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අයවැයගත කර්මාන්ත ඉටු කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) 2018 වර්ෂයේ අන්තර්ජාලය හා පුස්තකාල සේවය වෙනුවෙන් රු.800,000 ක ප්‍රතිපාදන සලසා | අයවැය ප්‍රතිපාදන නිසිපරිදි උපයෝජනය කළ යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| තිබුණද, ඒ සඳහා වියදම් කර තිබුණේ රු.150,000 ක මුදලක් පමණි. | | |
| (ii) දොරටියාව නව පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.850,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. | අයවැය ප්‍රතිපාදන නිසිපරිදි උපයෝජනය කළ යුතුවේ. | උප කාර්යාල දෙකක් එකවර සකස් කිරීම ගැටලු සහගත බැවින් එක් කාර්යාලක පමණක් ඉදිකිරීම් අවසන් කළ බව දන්වා සිටිමි. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 වර්ෂයේ රු.2,396,728 ක් වැයකර ඉදිකර තිබූ දම්බොක්ක නොදිරන කසල වර්ගීකරණ මධ්‍යස්ථානය භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | මූලික යටිතල පහසුකම් ලබාගෙන අදාළ අරමුණු ඉටුකර ගනිමින් කසල කළමනාකරණය විධිමත්ව සිදු කළ යුතුවේ. | මෙම මධ්‍යස්ථානයට ජලය, විදුලිය වැනි මූලික යටිතල පහසුකම් හා පිටතින් රැගෙන එන නොදිරන කසළ ලබා ගැනීමට අංගනයක් ඉදි කර නොතිබීම මෙයට ප්‍රධානම හේතුවයි. ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

**සේවක අතිරික්ත**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සංවර්ධන නිලධාරී සේවයේ අනුමත සංඛ්‍යාවට වඩා නිලධාරින් 22 ක් අතිරික්තව සේවයේ යොදවා තිබුණි. | අතිරික්ත විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සංවර්ධන නිලධාරින් 21 ක් වයඹ පලාත් පාලන දෙපාර්තමේන්තුව මගින් අනුයුක්ත කර ඇත. |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආයතන සංග්‍රහයේ IX වැනි පරිච්ඡේදයේ පළමු වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 1990 | අනුමැතියකින් තොරව ගෙවූ මුදල් අයකර | 1990 ජුනි 05 දිනැති පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ |

| | | |
|---|---|---|
| ජුනි 05 දිනැති පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 3 (ආ) ප්‍රකාරව ආණ්ඩුකාරවරයාගේ අනුමැතියකින් තොරව රාජ්‍ය ආයතන වලින් ලැබෙන විවිධ ප්‍රතිපාදන මත සංවර්ධන කටයුතු සිදුකිරීම වෙනුවෙන් 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සභා අරමුදලට ලැබී තිබූ පරිපාලන වියදමින් රු.2,386,631 මුදලක් සභාවේ සේවයේ නියුතු නිලධාරින් 22 නෙකු අතර බෙදා දී තිබුණි. | ගැනීමට කටයුතු කළ යුතුවේ. | චක්‍රලේඛය පිටපතක් ලබා ගෙන අධ්‍යනය කිරීමෙන් අනතුරුව පිළිතුරු ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. |

**3.4 ප්‍රසම්පාදන**

**කොන්ත්‍රාත් පරිපාලනය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| රු. 499,108 කින් සෙන්දිරියා පිටිය මාර්ගයේ සංවර්ධනය කර තිබූ ස්ථාන 04 සඳහා නිසි පරිදි තාර අලේප කර නොතිබීම නිසා අඟල් 1 ½ කැටගල් මතුවී පැවතුණි. මාර්ගය අවසාන කොටසේ ගල් ගිලා බැස වලවල් සෑදී තිබුණි. | ඉදි කිරීම් කටයුතු විධිමත්ව ඉටු කළ යුතුවේ. | අදාල නිලධාරින් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස පළාත් පාලන කොමසාරිස්තුමාට දන්වා යවා ඇත. |